Nestlé Good food, Good life

# මාධ්‍ය නිවේදනය

2021 නොවැම්බර් 4, කොළඹ

## මයිලෝ් නම 'Back to School' වැඩසටහනින් දරුවන් පාසලට සාදරයෙන් පිළිගනියි

පන්ති කාමර පදනම් කරගත් ඉගෙනුම් ක්‍රියාවලියට යළි සම්බන්ධ වීමට පාසල් ළමුන්ට සහාය වීමේ අරමුණින් විවිධ ක්‍රියාකාරකම් රැසක් සංවිධානය කිරීමට නෙස්ලේ මයිලෝ පසුගියදා පියවර ගත්තේය. ඒ, 'Back to School' නම් සිය වැඩසටහන යටතේ ය. සෞඛ්‍යමත් පරපුරක් ගොඩනැගීමෙහිලා මයිලෝ සතු අභිලාෂයේ කොටසක් ලෙස ක්‍රියාත්මක වන මෙම වැඩසටහන මගින් සියලුදෙනාගේ සුරක්ෂිතතාවය හා යහපත වෙනුවෙන් පාසලේදී සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කිරීමේ වැදගත්කම පිළිබඳ දරුවන්ට අවබෝධයක් පිරිනමන ලදී.

"පසුගිය වසර කිහිපය අපි හැමදෙනාටම, විශේෂයෙන්ම දරුවන්ට, අභියෝගකාරී කාලයක් විය. ජන ජීවිතය ක්‍රමානුකූලව සාමාන්‍ය අතට පත්වීමත් සමග නැවත පාසලට පැමිණි දරුවන්ට, වඩා සුරක්ෂිතව අධ්‍යාපන කටයුතුවල නිරත වීමට අත්වැලක් වීම අපගේ අරමුණයි. සැමවිටම සෞඛ්‍යමත් සහ ක්‍රියාශීලී ජීවන රටාවක් සඳහා දරුවන් දිරිමත් කිරීමට කැපවී සිටින වෙළඳ සන්නාමයක් වශයෙන්, නව සාමාන්‍ය තත්ත්වයේ අභියෝග මැද දරුවන් පාසලට නැවත කැඳවීමටත්, ඔවුන්ට අධ්‍යාපනය හා ක්‍රීඩා අංශයන්හි ඉදිරියට යාමටත්, බලධාරීන් ගන්නා වෑයමට සහාය වීමට ලැබීම අපට විශාල ගෞරවයක්", යනුවෙන් නෙස්ලේ ලංකා සමාගමේ කාණ්ඩ අලෙවි කළමනාකරු මොහොමඩ් අලි මහතා පැවසීය.

පළමු 'Back to School' වැඩසටහන 2021 නොවැම්බර් 1දා කෙළිමඬල කණිෂ්ඨ විද්‍යාලයේදී පැවැත්වුණි. ඒ දරුවන්ගේ මෙන්ම පාසල් කාර්යමණ්ඩලයේ ද ආරක්ෂාව සහතික කරමින්, සෞඛ්‍ය අමාත්‍යංශයේ සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කරමිනි. වැඩසටහන ආරම්භ වූයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු සෞඛ්‍යාරක්ෂිතව සිටීම පිළිබඳව ලබාදුන් දැනුවත් කිරීමේ වැඩසටහනකිනි. මෙහිදී සිය මිතුරන් හා ගුරුවරු සමඟ උපරිම සුරක්ෂිතබවකින් යුතුව කටයුතු කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳ ඔවුන්ට නිසි මඟපෙන්වීමක් හිමිවිය. තව ද ඔවුන්ගේ ආරක්ෂාවත් යහපතත් වෙනුවෙන් මුව ආවරණ සහ සැනිටයිසර් ආදිය පිරිනැමීමක් ද සිදුවිය. කොවිඩ්-19 ව්‍යාප්තිය වැළැක්වීම පිළිබඳ දැනුවත් කිරීමට සැකසූ අධ්‍යාපනික ද්‍රව්‍ය ද ඔවුන් අතර බෙදා දෙනු ලැබීය.

ආරක්ෂාකාරීව කටයුතු කිරීමට අවශ්‍ය හොඳ පුරුදු කියාදීමට අමතරව, පාසල තුළදී මෙන්ම නිවසේදීත් ක්‍රියාශීලීව කටයුතු කිරීමට දරුවන් දිරිමත් කිරීමට ද මෙහිදී පියවර ගැනුණි. ඒ අනුව සෞඛ්‍යමත් ජීවිතයක් සඳහා ශාරීරික ක්‍රියාකාරකම්වල වැදගත්කම

ඉස්මතු කරමින් ව්‍යායාම පෙරහුරුවක් ද පැවැත්වුණි. දරුවන්ට ශක්තිමත්ව සහ ජවසම්පන්නව ඉදිරි පාසල් වර්ෂය ජයගැනීමට සහායවීම වෙනුවෙන් එම ව්‍යායාම පෙරහුරුව සිදුකරන ලද්දේ පාසලේ ශාරීරික අධ්‍යාපන ගුරුවරුන් විසිනි.

අධ්‍යාපන අමාත්‍යාංශයේත්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේත් සහයෝගය සමඟ ඉදිරි සතිවලදී බස්නාහිර පළාතේ තවත් පාසල්වල මෙවැනි වැඩසටහන් පැවැත්වීමට නෙස්ලේ මයිලෝ සැලසුම් කර තිබේ.

වසර 115කට වැඩි කාලයක් පුරා මෙරට ක්‍රියාත්මක නෙස්ලේ සමාගමේ මයිලෝ යනු ලොව ප්‍රමුඛතම චොක්ලට් මෝල්ට් ආහාරමය පානය යි*. විටමින් සහ ඛනිජ ලවණවලින් සරු කළ මයිලෝ නිපදවනු ලබන්නේ උසස්ම තත්ත්වයේ එළකිරිවල යහ ගුණය, මෝල්ට් සාරය සහ හොඳම තත්ත්වයේ කෝකෝවා භාවිත කරමිනි. උසස්ම ප්‍රමිතිය වෙනුවෙන් ලොව පුරා ප්‍රසිද්ධියක් උසුළන නෙස්ලේ සමාගම, කුරුණෑගල පිහිටි තම අති නවීන නිෂ්පාදනාගාරයේදී මයිලෝ නිෂ්පාදනය කරයි.

*මූලාශ්‍රය - Euromonitor International Limited, Hot Drinks 2020 Edition, as per Malt Based Hot Drinks category definition.

---

Contact:

| | | | |
|---|---|---|---|
| Corp. Public Affairs | Damitha Kulatunga | +94777915949 | Damitha.Kulatunga@lk.nestle.com |